දෙවියන් වහන්සේවන ජේසුස්වහන්සේ ඉතා ඉක්මනින් මෙලොවට නැවත පැමිණෙන්නේය. මෙය වසර 2000 කට පෙර උන්වහන්සේ මෙලොවේ මිනිසුන් අතර ජීවත්ව සිටියදී දුන්නාවූ පොරොන්දුවක් ය. (ශු. යොහන් 14: 1-3). නිශ්චිතවම උන්වහන්සේ නැවත පැමිණෙනබව අපි ස්ථිර වශයෙන් දැනගන්නේ කොහොමද කියා ඔබ සිතනු ඇත.කරුණාකර උන්වහන්සේගේ නැවත පැමිණීම පිළිබඳ හා එම පැමිණීමට පෙර මෙලොවේ සිදුවන දේවල් පිළිබඳ ප්‍රකාශකරනලද අනාවැකි කියවන්න. ඉතා උනන්දුවෙන් හා පරීක්ෂාකාරී අන්දමින් මෙම දේව වචන කියවා වර්ථමාණයේදී මෙලොවේ සිදුවන දේවල් සමග සංසන්දනය කරනවිට අපගේ ජීවිත කාලයවන මෙම වර්ථමාණයේදීම උන්වහන්සේගේ නැවත පැමිණීම සිදුවිය හැකි බව මෙම සිදුවීම් අපට ඔප්පුකර පෙන්වා දෙනු ඇත.

## 1 දේවමාළිගාවේ විනාශය

ජේසුස්වහන්සේ දේවමාළිගාවෙන් නික්මයන කල මාළිගාවේ ගොඩනැගිලි උන්වහන්සේට පෙන්වන පිණිස ගෝලයෝ උන්වහන්සේ ළඟට ආවෝය. නුමුත් උන්වහන්සේ ඔහුට උත්තර දෙමින් ඔබ මේ මහත් ගොඩනැගිලි දකින්නෙහිද ? ගලක් පිට ගලක් ඉතුරුනොවන ලෙස ඒවා කඩාදමනු ලබන්නේයයි කීසේක (මතෙව් 24: 1-2/ මාක් 13: 1-2/ ලූක් 21: 5-6). **මෙය ක්‍රිස්තු වර්ෂ 70 වේදී සත්‍යවශයෙන්ම සිදුවිය**.

## 2 නැවත පැමිණීමේ ලකුණුඋන්වහන්සේ ඔලිව

කන්දේ වැඩහුන්කල ගෝලයෝ තනිව උන්වහන්සේ ළඟට ඇවිත්, "ඒ දේ කොයි කාලෙක සිද්ධවන්නේද? ඔබවහන්සේගේ නැවත පැමිණීමටත් ලෝකාන්තිමයටත් ලකුණු කිමෙක් දැයි අපට කිවමැනවයි කීවෝය. මෙම සිද්ධීන් සම්පූර්ණවන්නේ කොයි කාලෙකද?" - කියා ඇසුවෝය (මතෙව් 24: 3, මාක් 13: 3-4, ලූක් 21: 7).

## 3 මුළා කරන්නන්ගේ නැගිටීම

ජේසුස්වහන්සේ ඔවුන්ට උත්තරදෙමින්, "කිසිවෙක් නුඹලා මුළා නොකරන ලෙස බලාගනිල්ලා. මක්නිසාද බොහෝ දෙනෙක් මම ක්‍රිස්තුස්ය කියා මාගේ නමින් ඇවිත් බොහෝ දෙනෙකු මුළා කරන්නෝය. එම නිසා ඔවුන් පසුපසින් යෑමෙන් වලකින්න (මතෙව් 24:4-5; මාක් 13:5-6; ලූක් 21:8).

## 4 යුද්ධ සහ යුද්ධ ප්‍රවෘත්ති

යුද්ධ සහ යුද්ධ ප්‍රවෘත්ති ගැන නුඹලා අසනවා ඇත. නොකැලඹෙන්ට බලාගනිල්ලා, මක්නිසාද මේ සියල්ල සිදුවන්ට ඕනෑය. නුමුත් ඒ වන තුරුත් අන්තිමය නොපැමිණෙන්නේය (මතෙව් 24: 6, මාක් 13: 7, ලූක් 21: 9).

## 5 ජාතීන් අතර යුද්ධ|පොළෝකම්පා|සාගත|ලෙඩ රෝග

ජාතියක් ජාතියකටද, රාජ්‍යයක් රාජ්‍යකටද විරුද්ධව නැගිටිනවා ඇත. නොයෙක් තැන්වල සාගතද, පොළෝකම්පාද සිදුවෙනවා ඇත (මතෙව් 24: 7, මාක් 13: 8, ලූක් 21: 10-11).

## 6

මේ සියල්ල වනාහි ගාවිනාවල පටන් ගැනීමය (මතෙව් 24: 8, මාක් 13: 8).

## 7 ක්‍රිස්තු භක්තිකයින් පීඩා විඳීමට පාවාදීම

නුමුත් පරිස්සම් වන්න, මේ සියල්ලටම පෙර ඔවුන් ඔබට අත තබා නුඹලා පීඩා විඳීමට පාවාදී මරන්නෝය. නුමුත් ඒ සියල්ලටම පළමුව මාගේ නාමය නිසා ඔවුහුන් නුඹලා සිනගොග්ගවලටත් හිරගෙවල්වලටත් පාවාදෙමින් නුඹලාට පීඩා කරන්නෝය. ඒක නුඹලාට සාක්ෂියක් පිණිස වන්නේය (මතෙව් 24: 9, මාක් 13: 9, ලූක් 21: 12-13).

## 8

ඔවුහුන් නුඹලා අත් අඩංගුවට ගෙන ඉහළ නිළධාරින්ට භාරදෙන කල උත්තර දියයුතු කෙසේදැයි කලින් කල්පනා නොකරන්නට නුඹලාගේ සිත්හි නියමකරගනිල්ලා. මක්නිසාද නුඹලාගේ සියලු එදිරි කාරයින් විසින් විරුද්ධව සිටින්ටවත්, බොරුකරන්ටවත් බැරිවූ මුඛයක්ද, ප්‍රඥාවද මම නුඹලාට දෙන්නෙමි. එවිට කතා කරන්නේ නුඹලා නොව, ශුද්ධාත්මයානන් වහන්සේය (මාක් 13: 11, ලූක් 21: 14-15).

## 9 පවුලක් තුළම පාවාදීම

තවද, සහෝදරයා - සහෝදරයාද, පියා දරුවාද, මරණයට පාවා දෙන්නෝය දරුවෝද මවුපියන්ට විරුද්ධව නැගිට ඔවුන් මරණයට පත්කරවන්නෝය. මාගේ නාමය නිසා සියල්ලෝම නුඹලාට වෛර කරන්නෝය. නුමුත් නුඹලාගේ හිසේ තිබෙන කෙස්ගහක්වත් බිම නොවැටෙන්නේය. නුඹලාගේ ඉවසීම නිසා ආත්මය බේරාගනු ලබයි (මතෙව් 24: 9-10, මාක් 13: 12-13, ලූක් 21: 16-19).

## 10 ප්‍රේමය හීනවීම

අධර්මිෂ්ඨකම බෝවන බැවින් බොහෝ දෙනාගේ ප්‍රේමය හීනවන්නේය. නුමුත් අන්තිමයද දක්වා ස්ථිරව සිටින්නාම ගැළවෙන්නේය (මතෙව් 24: 12-13).

## 11 රාජ්‍යයේ මේ සුභාරංචිය

සියලු ජාතීන්ට සාක්ෂියක් පිණිස ලොව මුළුල්ලේ ප්‍රකාශ කරනු ලබන්නේය. **එවිට** අන්තිමය පැමිණෙන්නේය (මතෙව් 24:14, මාක් 13: 10).

## 12 යෙරුසලමේ පාළුකරන පිළිකුල

එහෙත් යම් කලක සේනාවන් විසින් යෙරුසලම වටලා සිටිනවා නුඹලා දකින්නහුද, එකල එහි විනාශය ආසන්නබව දැනගනිල්ලා (ලූක් 21: 20). එබැවින්, අනාගතවක්තෘවූ දානියෙල් විසින් කියනලද "*පාළුකරන පිළිකුල*" ශුද්ධසථානයෙහි තිබෙනවා නුඹලා යම් කලෙක දක්නහුද (කියවන්නා තේරුම් ගනීවා) එකල යුදයේ සිටින්නෝ කඳුවලට පලායෙත්වා. ගේ උඩ සිටින්නා තමාගේ ගෙයි තිබෙන දේ ගන්ට නොබසීවා කෙතෙහි සිටින්නාද තමාගේ වස්ත්‍රය ගන්ට ආපසු හැරී නොඒවා යුදයේ සිටින අය පිටවේවා ආපසු හැරී නො ඒවා (මතෙව් 24: 15-18, මාක් 13: 14-16, ලූක් 17: 31, 21: 21). නුමුත්, ඒ දවස්වල ගර්භිණීන්ටත් කිරි දෙන ස්ත්‍රීන්ටත් දුක්වේ. නුඹලාගේ පලායාම ශීත කාලයෙවත් "සබත්" දවසකවත් නොවන ලෙස යාචඥා කරපල්ලා (මතෙව් 24: 19-20, මාක් 13: 17-18, ලූක් 21: 23). ඔව්හු කඩු මුවහතින් වැටෙන්නේය, සියලු ජාතීන් අතරට වහලුන් මෙන් ගෙනයනු ලබන්නෝය, අන්‍යජතීන්ගේ කාලවල් සම්පූර්ණ වනතෙක් යෙරුසලම අන්‍යජාතීන් විසින් මඩිනු ලබන්නීය (ලූක් 21: 24).

## 13 ජාකෝබ්ගේ දවස්වල ඇතිවූ කරදර (යෙරෙමියා *30:6-7)*

මක්නිසාද, ලෝකයේ පටන්ගැනීමේ සිට මේ දක්වා නූණවූ, මතු කොයි කලෙකවත් නොවන්නාවූ මහත් පීඩාවක් *ඒ කාලයෙහි* වන්නේය, ඒ දවස් කෙටි නොකරන ලද්දෙව්නම් කිසි කෙනෙක් නොගැළවෙන්නේය. නුමුත් තෝරාගනු ලැබූවන් උදෙසා ඒ දවස් ලුහුඬු කරනු ලබන්නේය (මතෙව් 24: 21-22, මාක් 13: 19-20, ලූක් 21: 23). ලියනලද සියල්ල සම්පූර්ණවන පිණිස ඒ දවස් පළිගැනීමේ දවස් වන්නේය (ලූක් 21: 22).

## 14 බොරු ක්‍රිස්තුස් වරු සහ, බොරු අනාගතවකතෘවරු

එකල, යමෙක් කථාකොට: *බලව, ක්‍රිස්තුස්වහන්සේ මෙතනය, නොහොත් එතෙනයයි* නුඹලාට කියන්නේ නම් විශ්වාස නොකරපල්ලා, මක්නිසාද, බොරු ක්‍රිස්තුස්වරුද, බොරු අනාගතවකතෘවරුද නැගිට පුළුවන්නම්, තෝරාගනු ලැබූවන් පවා මුළා කරන ලෙස මහත් ලකුණුද, පුදුමද දක්වන්නෝය. බලව, මම නුඹලාට කලින් කීවෙමි (මතෙව් 24: 23-24, මාක් 13: 21-23). එබෙවින් ඔවුහු නුඹලාට කථාකොට *උන්වහන්සේ එහේ සිටී* මෙහේ සිටී කියා පවසනකල එය විශ්වාස නොකරපල්ලා මක්නිසාද, යම්සේ විදුලිය පෙරදිගින් නික්ම අපර දිග දක්වා පෙනේද, මනුෂ්‍ය පුත්‍රයාගේ ඊමත් එසේම වන්නේය (මතෙව් 24: 26-27, ලූක් 17: 23-24).

## 15 අහසේ ඇතිවන ලකුණු

තවද ඒ *දවස්වල* ඇතිවන්නාවූ පීඩාවලින් පසුව - ඉර අඳුරුවන්නේය, හඳ එහි එළිය නොදෙන්නේය, තාරකාවෝ අහසින් වැටෙන්නෝය, අහසේ බල පරාක්‍රමද සෙලවන්නෝය (මතෙව 24: 29, මාක් 13: 24-25, ලූක් 21: 25). පොළොවේ ජාතීන්ට දුක් වේදනා වන්නේය, මක්නිසාද, මුහුදෙත් රළ ගැසීමෙත් ඝෝෂාව නිසා වන වියවුලින් හා භයෙනුත් ලෝකයට පැමිණෙන්නාවූ දේ බලාපොරොත්තුව සිටීමෙනුත් මනුෂ්‍යයන්ගේ සිත් කලාන්තවන්නේය (ලූක් 21: 25-26).

## 16

එකල **මනුෂ්‍ය පුත්‍රයාගේ ලකුණ** අහසේ පෙනෙන්නේය, එවිට පොළොවේ සියලුම ගෝත්‍රයෝ වැලපෙන්නෝය, ඔවුහු මනුෂ්‍ය පුත්‍රයා බලයෙන්ද මහත් තේජසින්ද අහසේ වලාකුල් පිට එනවා දකින්නෝය. උන්වහන්සේ මහත් හොරණෑ ශබ්දයක් ඇතුව තමන් දූතයන් එවනසේක. ඔව්හු අහසේ එක් කෙළවරක සිට අනික් කෙළවර දක්වා සතර දිගින්ම උන්වහන්සේගේ තෝරාගත්තවුන් රැස්කරන්නෝය (මතෙව් 24: 30-31, මාක් 13: 26-27, ලූක් 21: 27).



17 මේ දේ සිදුවෙන්ට පටන්ගන්න කල, නුඹලාගේ මිදීම ළංවූ බැවින්, ඉහළ බලා, හිස් ඔසවාපල්ලායයි කීසේක (ලූක් 21: 28).

18 ජේසුස් වහන්සේ පවසා කීසේක, "අත්තික්කා ගහේ උපමාව ඉගෙනගනිල්ලා, එහි අතු මෘදුව කොළ හට ගන්න කල ග්‍රීෂම කාලය ලග බව නුඹලා දන්නහුය, **එසේම නුඹලා මේ සියල්ල දකින කල උන්වහන්සේගේ රාජ්‍යය දොරටු සමීපයෙහිම බවත් දැනගනිල්ලා"** (මතේව් 24: 32-33, මාක් 13: 28-29, ලූක් 21 :29-31). "නුමුත් ඒ දවස හා පැය මාගේ පියාණන් වහන්සේ මිස දන්නා කෙනෙක් නැත,සවර්ගයෙහි දේව දූතයන්වත්, පුත්‍රයාවත් දන්නේ නැත" (මතෙව් 24: 36, මාක් 13: 32).

19 **නෝවාගේ දවස්මෙන්** මනුෂ්‍ය පුත්‍රයාගේ ඊමත් වන්නේය, මක්නිසාද, ජල ගැලීමට පළමු දවස්වල දී, නෝවා නැවට ඇතුල් වූ දවස දක්වා, ඔහු කමින් බොමින් සරණපාවාගනිමින්, සරණපාවාදෙමින් සිටියෝය, ජලගැල්ම පැමිණ සියල්ලන්ම ගසාගෙන යන තුරු ඔව්හු නොදැන සිටියෝය (මතෙව් 24: 37-39, ලූක් 17: 26-27).

20 **ලෝත්ගේ දවස්වලදීත්** එසේම වූයේය, ඔව්හු කමින්, බොමින්, මිලේට ගනිමින්, විකුණමින්, වවමින්, ගොඩනගමින් සිටියෝය. ලොත් සෝදෝමිහි සිට පිටත්ව ගිය දවසේ අහසෙන් ගිනි සහ ගෙන්දගම් වැස සියල්ල විනාශ කලේය. මනුෂ්‍ය පුත්‍රයා ප්‍රකාශවන දවසේදීත් ඒ ආකාරම වන්නේය (ලූක් 17: 28-30).

21 ලෝත්ගේ භායර්‍යාව සිහි කරපල්ලා, තමාගේ ජීවිතය ලබාගන්ට සොයන්නා ඒක නැති කර ගන්නේය. තමාගේ ජීවිතය නැතිකරගන්නා ඒක ආරක්ෂා කර ගන්නේය (ලූක් 17: 32-33).

22 *ඒ රාත්‍රියේ* මනුෂ්‍යයෝ දෙදෙනෙක් එක යහනක වන්නෝය. එක් කෙනෙක් ගනු ලබන්නේය. අනික් එක්කෙනා අත්හරිනු ලබන්නේය. ස්ත්‍රීයෝ දෙදෙනෙක් එකට අඹරමින් සිටින්නෝය, එක තැනැත්තියක් ගනු ලබන්නීය. අනිත් තැනැත්තිය අත් හරිනු ලබන්නීය. මනුෂ්‍යයෝ දෙදෙනෙක් කුඹුරේ සිටින්නෝය එක් අයකු ගනු ලබන්නේය, අනිත් අය අත් හරිනු ලබන්නේය (මතෙව් 24: 40-41, ලූක් 17: 34-36). එවිට ඔව්හු උත්තර දෙමින් :"ස්වාමිනී, කොතැන්හිදැයි?" උන්වහන්සේට කීවෝය. උන්වහන්සේ ඔවුන්ට කීසේක "යම් තැනක මළකඳ ඇද්ද, ඒතැනට ගිජුලිහිණියෝත් රැස්වන්නෝයයි " කීසේක (මතෙව් 24: 28, ලූක් 17: 37).

23 **අවදිව සිට යාචඥා කිරීම.**
ඒ වනාහි තමාගේ දාසයන්ට බලයද, එකිනෙකාට තම තමාගේ වැඩද දී "අවදිව සිටින්නැයි දොරටු පාලයාටත් අණ දී, තමාගේ ගෙදරින් පිටත්ව ගොස් අන් රටක නැවතී සිටින මනුෂ්‍යයෙකුට සමානය, එබැවින් ගෙදර ස්වාමියා හදිසියෙන් ඇවිත් නුඹලා නිදා ඉන්නවා නොදක්නා පිණිස අවදිව සිටපල්ලා. මක්නිසාද ඔහු එන්නේ කොයි වේලේද, එනම් සවසද, මධ්‍යම රාත්‍රියේද, කුකුළා හඬලන වේලේද, අලුයමදැයි නුඹලා නොදන්නහුය. මම නුඹලාට කියනදේ සියල්ලන්ටම කියමි. අවදිව සිටපල්ලායයි කීසේක (මාක් 13: 34-36).

24 නුමුත් සොරා කොයි යාමයේ එන්නේදැයි ගෙයි ස්වාමියා දැනගන සිටියේ නම්, ඔහු අවදිව සිටිමින් තමාගේ ගෙය උමං කණින්ට නොදෙන බව දැනගනිල්ලා. එබැවින් නුඹලාත් සැදී සිටපල්ලා. මක්නිසාද නුඹලා නොසිතන පැයකෙදී මනුෂ්‍ය පුත්‍රයා එනසේක (මතෙව් 24: 43-44).

25 එහෙත් *ඒ දවස* මලපතක් මෙන් හදිසියෙන් නුඹලා කෙරේ නොපැමිණෙන පිණිස අධික කෑමෙන්ද බීමත් කමින්ද මේ ජීවිතයේ වෙහෙසින්ද නුඹලාගේ සිත් බර නොවන හැටියට බලාගනිල්ලා. මක්නිසාද, ඒක මුළු පොළෝතලය පිට වසන්නාවූ සියල්ලන් කෙරෙහි එසේ පැමිණෙන්නේය (මාක් 13 : 33, ලූක් 21: 34-35).

Local Contacts Address

26 ඒ බැවින් ඒ සිදුවන සියල්ලෙන් ජයගෙන ගැළවෙන පිණිසද මනුෂ්‍යපුත්‍රයා ඉදිරියෙහි සිටින පිණිසද කන්නලව්කරමින් සෑම කාලයේදීම අවදිව හිඳිල්ලායයි කීසේක (ලූක් 21: 36).

27 සැබවක් නුඹලාට කියමි, සියල්ල සිදුවන තුරු *මේ පරම්පරාව* පහව නොයන්නේය, අහසත් පොළවත් පහව යන්නේය, නුමුත් මාගේ වචන පහව නොයන්නේය (මතෙව් 24: 34-35, මාක් 13: 30-31, ලූක් 21: 32-33).

**ජේසුස්වහන්සේ තම මහිමයෙන් පිරි රාජාසනයෙන් සිට නිශ්චිතවම ඉතා ඉක්මනින් නැවත මෙලොවට මහත් බල සම්පන්නා තේජසෙන් හා දේවදූතයන්ගේ සේනාව සමගින් ද පැමිණෙන්නේය. ඔබගේ දෙවියන්වහන්සේ හමුවීමට ඔබ සූදානම් වන්න.**

**දෙවියන් වහන්සේට භයවී, උන්වහන්සේට ගෞරව දීපල්ලා.මක්නිසාද උන්වහන්සේගේ විනිශ්චයේ පැය පැමුණුණේය.අහසත් පොලොවත් මුහුදත් ජල උල්පතුත් මැවූ තෙනන්වහන්සේට නමස්කාර කරපල්ලා යයි කීය.** ( එළිදරව් 14:7 )

**කාලය තවදුරටත් ප්‍රමාද නොවන්නේය!**

**දෙවියන් වහන්සේගේ සවර්ගරාජ්‍යය ඉතා ආසන්නයි. දෙවියන් වහන්සේ වෙත සිත් යොමුකොට මෙම දේව වචනය විශ්වාස කරන්නග**

**ඔබගේ දෙවියන්වහන්සේ හමුවීමට ඔබ සූදානම් වන්න!**

ඒන්ජල් ටිවී නරඹන්න
www.angeltv.org



# දෙවියන් වහන් සේ ගේ රාජ්‍යයේ ශුභාරංචිය

සිංහල | SINHALA